OL/2023(2024)/40/S-I,II

65452

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations Sri Lanka Department of Examinations Sri Lanka Department of Examinations Sri Lanka Department

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**40 | S | I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)**
**General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)**

| | | |
|---|---|---|
| **සංගීතය (පෙරදිග)** | **I, II** | පැය තුනයි |
| சங்கீதம் (கீழைத்தேய) | I, II | மூன்று மணித்தியாலம் |
| **Music (Oriental)** | **I, II** | *Three hours* |

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## සංගීතය (පෙරදිග) I

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

※ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

※ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකය හා සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

※ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ගසරිම, මරිගප, _ _ _ _ වශයෙන් ආරෝහණ රූපයට යෙදෙන ශුද්ධ ස්වර අභ්‍යාසයේ හිස් තැනට අදාළ ස්වර හතර තෝරන්න.

(1) ප ම ග ධ (2) ප ම ප ධ (3) ප ග ප ධ (4) ප ග ම ධ

**2.** විකෘති ස්වර **නො යෙදෙන** රාගය තෝරන්න.

(1) යමන් (2) භූපාලි (3) කාෆි (4) භෛරවී

**3.** බිලාවල් රාගයට ආවේණික ස්වර සංගති ඇතුළත් වරණය තෝරන්න.

(1) ග ම රි, ග ප, ම ග ම රි ස
(2) ම රි ග, ප ග, ම ග රි ග ස
(3) ග රි ම, ග ප, ම රි ග රි ස
(4) ම ග රි, ප ග, ම රි රි ග ස

**4.** භෛරවී රාගයෙහි "මුඛ්‍යාංගය" තෝරන්න.

(1) ස ධ̲, ප ධ̲ ම ප ග̲ ම
(2) ස රි̲ ග̲ ම ග̲, ස රි̲ ස
(3) ම ග̲, ස රි̲ ස, ධ̲ නි̲ ස
(4) නි̲ ස ග̲ ම, ධ̲ ම ධ̲ ප

**5.** පංචමය සහ ෂඩ්ජය පිළිවෙළින් වාදි සහ සංවාදි ලෙස යෙදෙන නිර්දේශිත රාගය තෝරන්න.

(1) භූපාලි (2) බිලාවල් (3) යමන් (4) කාෆි

**6.** | 0 ගරි නිධ නිරි ගරි | 3 ග– නිරි ග– නිරි | x ග | ලෙසින් තානාලංකාරයක් යොදා ගත හැකි රාගය කුමක් ද?

(1) කාෆි (2) බිලාවල් (3) භූපාලි (4) යමන්

**7.** රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගැයීමට නියමිත කල්‍යාණ මේලගත රාගය තෝරන්න.

(1) භෛරවී (2) භූපාලි (3) කාෆි (4) බිලාවල්

**8.** බිලාවල් රාගය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) පූර්වාංගවාදී රාගයකි.
(2) ඖඩව ජාති රාගයකි.
(3) සියලුම ස්වර ප්‍රකෘති ස්වර ලෙස යෙදෙන රාගයකි.
(4) රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගැයීමට නියමිත රාගයකි.

[දෙවෙනි පිටුව බලන්න

**9.** භූපාලි රාගය සම්බන්ධයෙන් සරිගගරිස, රිගපපගරි වශයෙන් ආරෝහණ ක්‍රමයට යෙදෙන ස්වර අභ්‍යාසයේ අවරෝහණ රූපයෙහි පළමු සහ දෙවන ස්වර රටාවන් දෙක පිළිවෙළින් සඳහන් වන වරණය තෝරන්න.

(1) ස් නි ධ ධ නි ස් , ධ ප ග ග ප ධ (2) ස් ධ ප ප ධ ස් , ධ ප ග ග ප ධ
(3) ස් නි ධ ධ නි ස් , නි ධ ප ප ධ නි (4) ස් ධ ප ප ධ ස් , නි ධ ප ප ධ නි

**10.** රාගවල යෙදෙන ස්වර විශේෂ යටතෙහි **ගාන්ධාරය** සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) බිලාවල් රාගයෙහි සංවාදි ස්වරය ලෙස යෙදේ.
(2) කාෆි රාගයෙහි කෝමල ස්වරයක් ලෙස යෙදේ.
(3) යමන් රාගයෙහි වාදි ස්වරය ලෙස යෙදේ.
(4) භූපාලි රාගයෙහි වර්ජ්‍ය ස්වරයක් ලෙස යෙදේ.

**11.** "ධ" සහ "න" යන අවනද්ධාක්ෂර දෙවර්ගයම යෙදෙන තාල දෙකක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ජප් තාලය සහ දාදරා තාලය (2) දාදරා තාලය සහ කෙහෙර්වා තාලය
(3) කෙහෙර්වා තාලය සහ දීප්චන්දි තාලය (4) දීප්චන්දි තාලය සහ ත්‍රිතාලය

**12.** හින්දුස්තානි තාල පිළිබඳ සැලකීමේ දී, මාත්‍රා තුනකින් යුත් විභාග, එකක් වත් නො යෙදෙන තාලය තෝරන්න.

(1) දාදරා (2) ජප් (3) දීප්චන්දි (4) කෙහෙර්වා

● අංක **13** සහ **14** හි සඳහන් ප්‍රශ්න සඳහා පහත A, B, C යටතේ දක්වා ඇති තොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න.

A – දායාවෙන් හඬ උපදවීම
B – බායාවෙන් හඬ උපදවීම
C – දායා සහ බායා යන දෙකොටසින්ම එකවර හඬ උපදවීම

**13.** ඉහත A, B, C යටතෙහි සඳහන්ව ඇත්තේ තබ්ලාවෙන් අවනද්ධාක්ෂර උපදවන ආකාර තුනකි. ඒ අනුව පිළිවෙළින් |C|A|B|A| ලෙස හඬ උපදවන ආකාරයට යෙදී ඇති අවනද්ධාක්ෂර පෙළ නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

(1) |ධ – – ධ|තිට තිට|කත් තිට|ගෙ ගෙ තිට|
(2) |ධ – – ධි|න න තිට|කත් – ක|තිට තිට|
(3) |කත් තිට|තිට තිට|ධ ධ තිට|ගෙ ගෙ තිට|
(4) |ධ ගෙ තිට|කත් තිට|ධි න – ධ|තිට තිට|

**14.** ජප් තාලයෙහි ඨේකාවට අනුව හඬ උපදවීමේ නිවැරදි ක්‍රමය සඳහන් වරණය තෝරන්න.

(1) |B A|C C B|A A|C C B| (2) |C A|C C A|A A|C C A|
(3) |C A|C C A|B A|C C A| (4) |C B|C C B|B B|C C B|

**15.** හඬ නිෂ්පත්තිය හා සැලකීමේ දී හඬ තරංගයක ගොඩනැගෙන,

(1) ශීර්ෂ මගින් වායු අණු එකිනෙක තෙරපීම, විරලනය ලෙස හැඳින්වේ.
(2) නිම්න මගින් වායු අණු එකිනෙක ඉහිල්වීම, සම්පීඩනය ලෙස හැඳින්වේ.
(3) සමාකාරී කම්පනවලින් යුතු වන්නේ, නාදයයි.
(4) විස්තාරයෙන් නාදයෙහි උච්චනීච භේදය පෙන්නුම් කරයි.

**16.** ගසල් ගායනයට සුප්‍රසිද්ධ භාරතීය සංගීත ශිල්පියෙකු වන්නේ,

(1) හරිප්‍රසාද් චෞරසියා ය. (2) ඒ.ආර්. රහ්මාන් ය.
(3) ජග්ජිත් සිංග් ය. (4) ශකීර් හුසේන් ය.

- අංක **17** සහ **18** හි සඳහන් ප්‍රශ්න සඳහා පහත ස්වර ප්‍රස්තාරය ඇසුරින් පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| ග – ග | ප – ධ ප | ස්̇ – – | ස්̇ – ස්̇ – |
| නි – ධ | නි – රි̇ – | ග̇ – රි̇ | ස්̇ – – – |
| 0 | 3 | x | 2 |

**17.** ඉහත ස්වර ප්‍රස්තාර කොටසින් පිළිබිඹුවන රාගය තෝරන්න.

(1) භූපාලි (2) කාෆි (3) බිලාවල් (4) යමන්

**18.** ඉහත ස්වර ප්‍රස්තාරයට අදාළ හින්දුස්තානි තාලය වන්නේ,

(1) දීප්චන්දි තාලයයි. (2) ජප් තාලයයි. (3) ලාවනී තාලයයි. (4) ත්‍රිතාලයයි.

**19.** සමුද්‍රඝෝෂ විරිතට අනුව රචනා වී ඇති සේ ගී පාදයක් තෝරන්න.

(1) ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ
(2) පුන්මදාරා මල් දමින් යුත් දිගු සුනිල් වරලස ගොතා
(3) සුරරද සමන් සමගින් සුරඟන එ වර
(4) කලු ගල් තලාලයි පාරට දමන්නේ

**20.** "සේවිත පාද සරෝරුහ සංචිතයෙන් ඉතා" මෙම පහතරට සින්දු වන්නම ගැයෙන තිත

(1) මැදුම් තනිතිත වේ.
(2) සුළු මැදුම් දෙතිත වේ.
(3) මහ තනිතිත වේ.
(4) මැදුම් මහ දෙතිත වේ.

**21.** "දොඩම් කපාලා ඇඹුල් තනාලා" කෙළි ගීතය අයත් වන ජනක්‍රීඩාව තෝරන්න.

(1) අං කෙළිය
(2) ඔළිඳ කෙළිය
(3) ලී කෙළිය
(4) මේවර කෙළිය

**22.** කෝට්ටේ යුගයේ රචනා වූ සැළලිහිණි, ගිරා සහ පරෙවි වැනි සන්දේශ කාව්‍ය ඇතුළත් ග්‍රන්ථ හැඳින්විය හැක්කේ

(1) සේ ගී ග්‍රන්ථ ලෙස ය.
(2) මෙහෙ ගී ග්‍රන්ථ ලෙස ය.
(3) ඇදහිලි ගී ග්‍රන්ථ ලෙස ය.
(4) සමාජ ගී ග්‍රන්ථ ලෙස ය.

**23.** දයානන්ද ගුණවර්ධන සූරීන්ගේ ගජමන් පුවත, මධුර ජවනිකා සහ ජසයා හා ලෙන්චිනා වැනි නාට්‍ය සඳහා සංගීත නිර්මාණයෙන් දායක වූ සංගීතඥයා වන්නේ

(1) ඩබ්ලිව්.බී. මකුලොලුව ය.
(2) ලයනල් රන්වල ය.
(3) සී. ද එස්. කුලතිලක ය.
(4) රෝහණ බැද්දගේ ය.

**24.** 'දුනු කෙයියා මලක් වගේ දුරට පෙනෙනවා' ගීතය

(1) පියගුණ වරුණ ගීතයකි.
(2) මව්ගුණ වරුණ ගීතයකි.
(3) දේශාභිමානී ගීතයකි.
(4) පරිසර වර්ණනාත්මක ගීතයකි.

**25.** 'පාරමිතා බල පූරිත පූජිත බුද්ධ දිවාකරයාණෝ' ගීතයට අදාළ තාලය වනුයේ

(1) දීප්චන්දි තාලයයි. (2) ජප් තාලයයි. (3) කෙහෙර්වා තාලයයි. (4) දාදරා තාලයයි.

**26.** වික්ටර් රත්නායකයන් විසින් සංගීත අධ්‍යක්ෂණය කරන ලද 'හුලවාලි' චිත්‍රපටයේ ඇතුළත් ගීතයක් තෝරන්න.

(1) උන්මාද සිතුවම්
(2) ආරිච්චි බෝරිච්චි
(3) ගලන ගඟකි ජීවිතේ
(4) කුලගෙදරින් දුම්බර කඳුවැටියේ

**27.** "තෙරේ මේරේ මිලන් කී" ගීතය අයත් හින්දි චිත්‍රපටය තෝරන්න.

(1) ජනක් ජනක් පායල් බාජේ
(2) මධුමතී
(3) අභිමාන්
(4) බෛයිජු බාවරා

**28.** "සුදු සඳ එළියේ නලමත පොපියන" ගීතයේ පද ප්‍රබන්ධ කර ඇත්තේ

(1) මහගමසේකර විසිනි.
(2) ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ විසිනි.
(3) ප්‍රේමකීර්ති ද අල්විස් විසිනි.
(4) මර්සලීන් ජයකොඩි පියතුමා විසිනි.

[හතරවෙනි පිටුව බලන්න

**29.** ග්‍රැමෆෝන් තැටි යුගයට අයත් ගීතයක් තෝරන්න.

(1) බැස සීතල ගඟුලේ (2) ගලන ගඟකි ජීවිතේ

(3) හෝපලු වනපෙත (4) සිනිඳු සුදු මුතු තලාවේ

**30.** ගුවන් විදුලි සරල ගී, මුල් යුගයට අයත් සංගීතඥයෙකු තෝරන්න.

(1) සූර්ය ශංකර් මොල්ලිගොඩ (2) කරුණාරත්න දිවුල්ගනේ

(3) සුනිල් එදිරිසිංහ (4) එච්.ආර්. ජෝතිපාල

**31.** අපරදිග ස්වර ප්‍රස්තාරකරණයේ දී මාත්‍රා හයක නිශ්ශබ්දතාවය දැක්වීම සඳහා යොදනු ලබන සංකේතය හඳුන්වනුයේ,

(1) ඩොටඩ් මිනිම් රෙස්ට් (Dotted Minim Rest) ලෙස ය.

(2) ඩොටඩ් ක්වේවර් රෙස්ට් (Dotted Quaver Rest) ලෙස ය.

(3) ඩොටඩ් සෙමි බ්‍රීව් රෙස්ට් (Dotted Semi breve Rest) ලෙස ය.

(4) ඩොටඩ් ක්‍රොචට් රෙස්ට් (Dotted Chrochet Rest) ලෙස ය.

**32.** අපරදිග සංගීතයෙහි එක් ස්කේලයක් තුළ (Scale) භාවිත කළ හැකි Major Chords ගණන

(1) 2 කි. (2) 3 කි. (3) 4 කි. (4) 5 කි.

**33.** ධ <u>රි</u> ග ස්වර තුන ඇතුළත් ස්වර සංචය (chord) තෝරන්න.

(1) A Minor (2) D Minor (3) A Major (4) D Major

**34.** | ග ප ප ධ | ම – – – | ග ග ග ස | රි – – – |

ඉහත ස්වර පාදය හා ගැළපෙන (සංවාද වන) හාමනි (Harmony) ස්වර පාදය තෝරන්න.

(1) | ප නි නි ස̇ | ධ – – – | ප ප ප ග | ම – – – |

(2) | ම ග ග රි | ස – – – | ස ස ස ග | ම – – – |

(3) | ග රි රි ම | ග – – – | ප ප ප ග | රි – – – |

(4) | ස ග ග ම | ධ – – – | ප ප ප ම | ග – – – |

**35.** සී නැචුරල් මයිනර් (C Natural Minor) ස්කේලයට අයත් නිවැරදි ස්වර සඳහන් වරණය තෝරන්න.

(1) ස <u>රි</u> <u>ග</u> ම ප <u>ධ</u> <u>නි</u> ස̇ (2) ස රි <u>ග</u> ම ප <u>ධ</u> <u>නි</u> ස̇

(3) ස රි <u>ග</u> ම ප ධ <u>නි</u> ස̇ (4) ස <u>රි</u> ග ම ප <u>ධ</u> නි ස̇

**36.** පහත සඳහන් උපකරණ අතුරෙන්, පටිගත කරන ලද ගීතයක් ගබඩා කර ගත හැකි උපකරණය තෝරන්න.

(1) හෙඩ්ෆෝන් (Head phone) (2) මයික්‍රෝෆෝන් (Microphone)

(3) මිඩි කේබල් (Midi cable) (4) USB පෙන් ඩ්‍රයිව් (USB Pen drive)

**37.** මල්ටි ට්‍රැක් රෙකෝඩින් (Multi Track Recording) සඳහා යොදා ගත හැකි මෘදුකාංගයක් තෝරන්න.

(1) Adobe reader (2) PageMaker

(3) InDesign (4) Logic pro

**38.** සුෂිර වාද්‍ය ගණයට අයත් **නොවන** ස්වර පුවරු සහිත වාද්‍ය භාණ්ඩයක් තෝරන්න.

(1) පියානෝ (2) එකෝඩියන් (3) මෙලෝඩිකා (4) හාර්මෝනියම්

**39.** දේශීය භාණ්ඩ වර්ගීකරණයෙහි තාල වාද්‍ය විශේෂ පමණක් දැක්වෙන වරණය තෝරන්න.

(1) ආතත, විතත, ඝණ, සුෂිර (2) විතත, විතතාතත, ඝණ, සුෂිර

(3) ආතත, විතත, විතතාතත, ඝණ (4) ආතත, විතත, විතතාතත, සුෂිර

**40.** පර්දා (frets) යොදා ස්වර ස්ථාන පෙන්නුම් කර ඇති තත් වාද්‍ය භාණ්ඩ තුනක් ඇතුළත් වරණය තෝරන්න.

(1) සිතාර්, ගිටාර්, එස්රාජ් (2) ගිටාර්, එස්රාජ්, වයලින්

(3) වයලින්, දිල්රුබා, වීණා (4) වීණා, සිතාර්, තාම්පුරා

* *

[පස්වෙනි පිටුව බලන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**40 S I, II**

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
## கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
## General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

**සංගීතය (පෙරදිග) I, II**
சங்கீதம் (கீழைத்தேய) I, II
Music (Oriental) I, II

### සංගීතය (පෙරදිග) II

✻ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
✻ සියලු ම ප්‍රශ්න සඳහා ලකුණු 12 බැගින් හිමි වේ.

**1.** අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(i) රාගයකට අනන්‍ය වූ සුවිශේෂී අංග සහ විස්තර ඇතුළත් රාගධාරී ගීත ප්‍රබන්ධ හඳුන්වනු ලබන සුවිශේෂී නාමය ලියන්න.

(ii) රාගයකට අදාළ ස්වර සහ සංගති ඇතුළත්ව ස්ථායි, අන්තරා වශයෙන් නිර්මාණය වී ඇති තාලානුකූල රාගධාරී ස්වර ප්‍රබන්ධ හඳුන්වනු ලබන සුවිශේෂී නාමය ලියන්න.

(iii) රාගධාරී සංගීතයේදී ශ්‍රැති වාදනය සඳහා යොදා ගැනෙන තත් සතරකින් යුත් සංගීත භාණ්ඩයේ නම ලියන්න.

(iv) හින්දුස්තානි සංගීතයට අනුව ලයෙහි ප්‍රභේද **තුන** නම් කරන්න.

- අංක (v) සිට (viii) තෙක් ඇති ප්‍රශ්න යටතේ යෙදී ඇති හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(v) දේශාභිමානී ගීතයක් වන "ලංකා ලංකා පෙම්බර ලංකා" ගීතයේ මුල් ගායනය සිදුකර ඇත්තේ ...................... සූරීන් විසිනි.

(vi) "ප්‍රේමයෙන් මන රංජිත වේ නන්දිත වේ" ගීතය ඇතුළත් නව නාට්‍යය නිෂ්පාදනය කරන ලද්දේ ...................... සූරීන් විසිනි.

(vii) "මන්මත් කරවන - දන මුළු දෙරණා" පැදි පාදයට අයත් සඳැස්මත් සංඛ්‍යාව .................. කි.

(viii) ජන ගී ප්‍රස්තාරකරණයේදී සමග්‍රහ, .................. සහ විෂමග්‍රහ වශයෙන් ග්‍රහ පිහිටුවන ආකාර තුනකි.

(ලකුණු 01 × 08 = 08 යි)

- අංක (ix) සහ (x) ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(ix) විභාග දෙකක් පමණක් යෙදෙන නිර්දේශිත හින්දුස්තානි තාල දෙකක් වනුයේ (a)............ තාලය සහ (b)............ තාලයයි.

(x) නූර්ති සඳහා යොදා ගැනෙන ප්‍රධාන අවනද්ධ වාද්‍ය භාණ්ඩය (a)............ නමින් හැඳින්වෙන අතර නාඩගම් සඳහා (b)...................... නම් අවනද්ධ වාද්‍ය භාණ්ඩය යොදා ගැනේ.

(ලකුණු 02 × 02 = 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

[හයවැනි පිටුව බලන්න

**2.** (i) පහත A, B, C අක්ෂර යටතෙහි සඳහන් කරුණුවලින් හඳුනාගත හැකි නිර්දේශිත රාග තුනෙහි නම් අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග වෙන වෙන ම ලියන්න.

A – විකෘති ස්වර එකක් පමණක් ඇතුළත්ව ස්වර 7ක් යෙදෙන රාගයකි.

B – විකෘති ස්වර දෙකක් පමණක් ඇතුළත්ව ස්වර 7ක් යෙදෙන රාගයකි.

C – විකෘති ස්වර හතරක් පමණක් ඇතුළත්ව ස්වර 7ක් යෙදෙන රාගයකි. (ලකුණු 03 යි)

(ii) ඉහත කරුණුවලින් පිළිබිඹු වන රාග තුනෙන්, ඔබ කැමති රාගයකින්, **පහත එක් වර්ගයකට අදාළ ව ස්ථායි කොටසෙහි** ස්වර ප්‍රස්තාරය නියමිත තාල සංකේත ද සහිතව ලියන්න.

- මධ්‍යලය ඛ්‍යාල් ගීතය
- මධ්‍යලය ගත් වාදිතය
- රාග ලක්ෂණ ගීතය
- සර්ගම් ප්‍රබන්ධය (ලකුණු 05 යි)

(iii) ඉහත A, B හා C හි සඳහන් කරුණුවලින් පිළිබිඹුවන රාග තුනෙන්, **ඔබ කැමති එක් රාගයකට** අදාළව **මාත්‍රා 8 කට නො අඩු** තානාලංකාර **දෙකක්** වෙන වෙන ම ලියන්න. (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

**3.** (i) පහත A සහ B අක්ෂර යටතෙහි සඳහන් රාග සංගතිවලින් පිළිබිඹුවන හින්දුස්තානි රාග දෙකෙහි නම් අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග වෙන වෙන ම ලියන්න.

A – ග ප, ධ නි සං, සං නි ධ ප

B – ප ග, ධ ප ග, රි ස ධස (ලකුණු 02 යි)

(ii) ඉහත A හා B හි සංගතිවලින් පිළිබිඹුවන රාග දෙකෙන් **එක් රාගයක් තෝරාගෙන** පහත දී ඇති උපදෙස් අනුව ස්වර රචනාවක් නිර්මාණය කරන්න.

උපදෙස් :-
- තෝරාගත් රාගයට අදාළව A හෝ B හි දක්වා ඇති ස්වර සංගතියක් නිර්මාණයෙහි ඇතුළත් විය යුතු ය.
- ත්‍රිතාලයෙහි ආවර්ත දෙකක් සම්පූර්ණ වන ලෙස නිර්මාණය ගොඩනගා තිබිය යුතු ය.
- නිර්මාණය ස්වර ප්‍රස්තාර කර තිබිය යුතු ය. (ලකුණු 06 යි)

(iii) දීප්චන්දි තාලයෙහි ඨේකාව නියමිත මාත්‍රා විභාග අනුව තාල සංකේත ද සහිතව සමලයෙන් යුතුව ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

**4.** (i) 'මෙහෙ ගී' යටතට ගැනෙන ජන ගී වර්ග **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත දැක්වෙන ජන ගී පාද ආඝාතාත්මකව ගයන ලද ගී පාද සහ අනාඝාතාත්මකව ගයන ලද ගී පාද වශයෙන් කොටස් දෙකක් යටතේ බෙදා වෙන්කර ලියන්න.

(a) තණ්ඩලේ දෙන්නා දෙපොලේ දක්කනවා

(b) උදයට පායන හිරු දෙවියන්ටයි

(c) බුද්ධං සරණේ සිරස දරාගෙන

(d) මලේ මලේ ඔය නා මල නෙලා වරෙන්

(e) රැගත් සුරා පිරූ විතින්

(f) වෙල්යායක ගොන් දෙන්නෙක් කකා උනී

(g) ඔළිඳ තිබෙන්නේ කොයි කොයි දේසේ

(h) රන් දැ කැති ගෙන නිති සැරසෙනවා (ලකුණු 04 යි)

(iii) වන්නම් සම්ප්‍රදායන් තුන හා සම්බන්ධව තිරස් අතට ගැළපෙන ලෙස සකසා ඇති පහත වගුවෙහි A සිට F දක්වා හිස්තැන්වලට නියමිත කරුණු අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග ලියන්න.

| වන්නම් අයත් සම්ප්‍රදාය | භාවිත වන ප්‍රධාන අවනද්ධ වාද්‍ය භාණ්ඩය | භාවිතයේ පවතින වන්නම් ගණන |
|---|---|---|
| (A) .............................. | ගැටබෙරය | (B) .............................. |
| (C) .............................. | (D) .............................. | 18 |
| පහතරට | (E) .............................. | (F) .............................. |

(ලකුණු 03 යි)

(iv) ප්‍රධාන වන්නම් සම්ප්‍රදාය තුනට අයත් වන්නම් **තුනක්** අදාළ සම්ප්‍රදාය සමග වෙන වෙනම නම් කරන්න.

(ලකුණු 03 යි)

**(මුළු ලකුණු 12 යි)**

5\. (i) නූර්ති නාට්‍ය නිෂ්පාදකයින් **දෙදෙනෙක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) නූර්ති රංග සම්ප්‍රදායේ සංගීතමය ලක්ෂණ **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii) පහත දැක්වෙන්නේ දුටුගැමුණු නූර්තියට අයත් ගීතයක ස්ථායි කොටසේ ස්වර ප්‍රස්තාරයයි. එම ස්වර ප්‍රස්තාරය, ගීතයේ පදමාලාව ද සහිතව නැවත ගීත ස්වර ප්‍රස්තාර කරන්න.

| | | | |
|---|---|---|---|
| ධ ප ධ | ස – රි | ග – ධ | ප – ප |
| ග ග රි | ස – රි | සරිගරි | ස – – |
| ප ධ නි | ස – ධ | ම – ධ | ප – ප |
| ග ග රි | ස – රි | සරිගරි | ස – – |

(ලකුණු 06 යි)

**(මුළු ලකුණු 12 යි)**

6\.




(i) ඉහත දැක්වෙන අපරදිග ස්වර ප්‍රස්තාර කොටස පෙරදිග සංගීත ස්වර ප්‍රස්තාර ක්‍රමයට පෙරළා තාලානුකූලව ප්‍රස්තාර කරන්න.

(ලකුණු 04 යි)

(ii) පහත රූප සටහනෙහි ඉංග්‍රීසි අක්ෂර A සිට F දක්වා ඇතුළත් අපරදිග සංගීත ප්‍රස්තාර සංකේත හඳුන්වනු ලබන යෙදුම්, පහත දී ඇති යෙදුම්වලින් තෝරා අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග ලියන්න.


- ශුද්ධ ලකුණ (Natural Mark), කෝමල ලකුණ (Flat Mark), ක්‍රොචට් රෙස්ට් (Crochet Rest), ටයිම් සිග්නේචර් (Time Signature), කී සිග්නේචර් (Key Signature), ට්‍රෙබල් ක්ලෙෆ් (Treble Clef), බේස් ක්ලෙෆ් (Bass Clef)

| A | B | C | D | E | F |
|---|---|---|---|---|---|



(ලකුණු 06 යි)

(iii) පහත A යටතෙහි දැක්වෙන සංකේතය සහ B යටතෙහි දැක්වෙන ස්වර ප්‍රස්තාරය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| A | B |
|---|---|
|  | \| ස – ස   ග – ම \| ප – –   ධ – – \| නි – ධ   ප – ම \| ග – –   – – – \| |

(a) A අක්ෂරයෙන් දැක්වෙන සංඥෙතයෙන් පිළිබිඹුවන අපරදිග ස්කේලය (scale) නම් කරන්න.

(b) B අක්ෂරයෙන් දැක්වෙන කොටසෙහි සඳහන් ස්වර ප්‍රස්තාරය අපරදිග රේඛා මණ්ඩලය මත ප්‍රස්තාර කිරීමේදී යොදනු ලබන ටයිම් සිග්නේචරය (Time Signature) ලියන්න.

(ලකුණු 02 යි)

**(මුළු ලකුණු 12 යි)**

**7.** පහත සඳහන් ප්‍රශ්න අතුරෙන් **තුනක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.

(i) ග්‍රැමෆෝන් ගීතවල සුවිශේෂ ලක්ෂණ **දෙකක්** ලියා, ග්‍රැමෆෝන් ගීත සඳහා තනු නිර්මාණය කළ සංගීතඥයෙකු හා එම යුගයේ නිර්මාණය වූ ජනප්‍රිය ගීතයක් නම් කරන්න.

(ii) කපිරිඤ්ඤා ගීතවල සුවිශේෂ ලක්ෂණ **තුනක්** ලියා, එම ගී තනුවක් ආශ්‍රයෙන් නිර්මාණය කර ඇති සරල ගීතයක් නම් කරන්න.

(iii) 60-70 දශකයේ මෙරට බිහි වූ කණ්ඩායම් සංගීතයේ සුවිශේෂ ලක්ෂණ **දෙකක්** ලියා, එම දශකය තුළ බිහි වූ ප්‍රචලිත සංගීත කණ්ඩායමක් හා ගීතයක් නම් කරන්න.

(iv) නිර්දේශිත නව නාට්‍ය **දෙකක** නම් ලියා, එම නාට්‍ය දෙකෙහි ඇතුළත් ගීත **දෙකක** පළමු ගී පාදය බැගින් ලියන්න.

**(ලකුණු 04 × 03 = 12 යි)**

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

# 40 - සංගීතය (පෙරදිග)

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

## 40 - සංගීතය (පෙරදිග)

## ලකුණු දීමේ පටිපාටිය

I පත්‍රයට - 1 × 40 = 40

II පත්‍රයට - පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුයි .

- එක් ප්‍රශ්නයකට ලකුණු 12 × 05 = 60

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) .............................................. ✓ $\frac{4}{5}$ (△)

(ii) .............................................. ✓ $\frac{3}{5}$ (△)

(iii) .............................................. ✓ $\frac{3}{5}$ (△)

(03) (i) $\frac{4}{5}$ (ii) + $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ — එකතුව → $\frac{10}{15}$ (□)

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.

II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.

III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.

IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.

V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.

VI. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- (I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍යපෙළ පෙළ ) විභාගය - 2023(2024)

## 40 - සංගීතය පෙරදිග

## එක් එක් ප්‍රශ්න පත්‍රයේ ලකුණු ප්‍රදානය කිරීම පිළිබඳ සාරාංශය

සංගීතය (පෙරදිග) 1

- මෙම ප්‍රශ්න පත්‍රයේ බහුවරණ ප්‍රශ්න 40 කි.
- ලකුණු 01 බැගින් මුළු ලකුණු 40 කි.

සංගීතය (පෙරදිග) 11

මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 7 කි. ඉන් පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. එක් ප්‍රශ්නයනට ලකුණු 12 බැගින් ප්‍රශ්න 05 කට මුළු ලකුණු 60 කි.

සංගීතය (පෙරදිග) 11

1 වන ප්‍රශ්නය

i. ලකුණු 01

ii. ලකුණු 01

iii. ලකුණු 01

iv. ලකුණු 01

v. ලකුණු 01

vi. ලකුණු 01

vii. ලකුණු 01

viii. ලකුණු 01

ix. ලකුණු 02

x. ලකුණු 02 මුළු ලකුණු 12 යි.

2 ප්‍රශ්නය

i. ලකුණු 03

ii. ලකුණු 05

iii. ලකුණු 04 මුළු ලකුණු 12 යි.

3 ප්‍රශ්නය

i. ලකුණු 02

ii. ලකුණු 06

iii. ලකුණු 04 මුළු ලකුණු 12 යි.

4 ප්‍රශ්නය

i. ලකුණු 02

ii. ලකුණු 04

iii. ලකුණු 03

iv. ලකුණු 03 මුළු ලකුණු 12 යි.

5 ප්‍රශ්නය

i. ලකුණු 02

ii. ලකුණු 04

iii. ලකුණු 06 මුළු ලකුණු 12 යි.

6 ප්‍රශ්නය

i. ලකුණු 04

ii. ලකුණු 06

iii. ලකුණු 02 මුළු ලකුණු 12 යි.

7 ප්‍රශ්නය

- තෝරා ගත් මාතෘකා තුනකට (3) ලකුණු 4 × 3 =12 ක් හිමි වේ.

මුළු ලකුණු 12 යි.

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගය - 2023(2024)

### 40 පෙරදිග සංගීතය - 1

**අභිමතාර්ථ**

1. ස්වර අභ්‍යාසයක ආරෝහණ ස්වරූපය ගොඩ නගයි.
2. විකෘති ස්වර නො යෙදෙන රාගය තෝරයි.
3. බිලාවල් රාගයේ ස්වර සංගතිය තෝරයි.
4. භෛරවී රාගයේ මුඛ්‍යාංගය තෝරයි.
5. පංචමය සහ ෂඩ්ජය වාදි සංවාදි වන රාගය තෝරයි.
6. තානාලංකාරය ඇතුළත් රාගය හඳුනා ගනී.
7. මේලයට අදාළ ව ගානසමය යෙදෙන රාගය තෝරයි.
8 රාග පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරයි.
9. රාග පදනම් වූ ස්වර අභ්‍යාසයේ පළමු හා දෙවන ස්වර රටාවන් තෝරයි.
10. රාගයට අදාළ වන වැරදි ප්‍රකාශය හඳුනා ගනී.
11. අවනද්ධාක්ෂර අනුව තාල දෙක තෝරයි.
12. මාත්‍රා තුනකින් යුත් විභාග එකක් වත් නො යෙදෙන තාලය තෝරයි.
13. තබ්ලාවෙන් උපදින අක්ෂර හඳුනා ගනී.
14. තබ්ලා ඨේකාවට අනුව හඬ උපදවීමේ නිවැරදි ක්‍රමය තෝරයි.
15. හඬ තරංගයක් ගොඩනැගෙන ආකාරය හඳුනා ගනී.
16. භාරතීය ගසල් ගායන ශිල්පියෙකු තෝරයි.
17. ස්වර ප්‍රස්තාරයෙන් දැක්වෙන රාගය හඳුනා ගනී.
18. ස්වර ප්‍රස්තාරයෙන් දැක්වෙන හින්දුස්තානි තාලය තෝරයි.
19. සමුද්‍රඝෝෂ විරිතට අයත් සේ ගී පාදය තෝරයි.
20. සින්දු වන්නම ගැයෙන 'තිත' හඳුනා ගනී.
21. කෙළි ගීතය අයත් වන ජන ක්‍රීඩාව තෝරයි.
22. කෝට්ටේ යුගයේ රචනා වූ සංදේශ කාව්‍ය ග්‍රන්ථ හඳුන් වන නාමය තෝරයි.
23. දයානන්ද ගුණවර්ධනයන්ගේ කලා නිර්මාණයන්ට සංගීතයෙන් දායක වූ සංගීතඥයෙකු හඳුනා ගනී.
24. මව්ගුණ ගීතය තෝරයි.
25. ගීතයට අදාළ හින්දුස්තානි තාලය හඳුනා ගනී.

26. චිත්‍රපට ගීතයක සංගීත අධ්‍යක්ෂවරයා තෝරයි.

27. ගීතය ඇතුළත් හින්දි චිත්‍රපටය තෝරයි.

28. ගී පද ප්‍රබන්ධකයා හඳුනා ගනී.

29. ග්‍රැමෆෝන් ගීතයක් තෝරයි

30. මුල් යුගයට අයත් වන ගුවන් විදුලි සරල ගී ගායකයෙකු තෝරයි.

31. මාත්‍රා 6 ක නිශ්ශබ්දතාවය දැක්වීමට යොදනු ලබන සංකේතය හඳුනා ගනී.

32. ස්කේලයක මේජර් කෝර්ඩ් ගණන තෝරයි.

33. ධ රි ග යන ස්වර 3 අයත්වන බටහිර කෝර්ඩ් එක හඳුනා ගනී.

34. ස්වර පාදයකට 'හාර්මනි' වන ගී පාද තෝරයි.

35. සී නැචුරල් මයිනර් ස්කේලයට ගැළපෙන වරණය තෝරයි.

36. සංගීතය හා බැඳි තාක්ෂණික මෙවලම් හඳුනා ගනී.

37. මෘදුකාංගයක් තෝරයි.

38. සුෂිර ගණයට අයත් නො වන ස්වර පුවරු වාද්‍ය භාණ්ඩය තෝරයි.

39. දේශීය භාණ්ඩ වර්ගීකරණය අනුව තාල වාද්‍ය සඳහා පමණක් සුවිශේෂී කොටස් ඇතුළත් වරණය තෝරයි.

40. 'පර්දාවලින්' යුතු තත් වාද්‍ය තෝරයි.

OL/2023(2024)/40/S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**40 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)**
**General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)**

| | | |
|---|---|---|
| **සංගීතය (පෙරදිග)** | **I, II** | පැය තුනයි |
| சங்கீதம் (கீழைத்தேய) | I, II | மூன்று மணித்தியாலம் |
| **Music (Oriental)** | **I, II** | Three hours |

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## සංගීතය (පෙරදිග) I

උපදෙස්:
- ❋ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ❋ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ❋ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකය හා සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- ❋ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** සගරිම, මරිගප, _ _ _ _ ක්‍රමයෙන් ආරෝහණ රූපයට යෙදෙන ශුද්ධ ස්වර අභ්‍යාසයේ හිස් තැනට අදාළ ස්වර හතර තෝරන්න.

(1) පමගධ (2) පමපධ (3) පගපධ (4) පගමධ

**2.** විකෘති ස්වර **නො** යෙදෙන රාගය තෝරන්න.

(1) යමන් (2) භූපාලි (3) කාෆි (4) භෛරවී

**3.** බිලාවල් රාගයට ආවේණික ස්වර සංගති ඇතුළත් වරණය තෝරන්න.

(1) ග ම රි, ග ප, ම ග ම රි ස
(2) ම රි ග, ප ග, ම ග රි ග ස
(3) ග රි ම, ග ප, ම රි ග රි ස
(4) ම ග රි, ප ග, ම රි රි ග ස

**4.** භෛරවී රාගයෙහි "මුඛ්‍යාංගය" තෝරන්න.

(1) ස ධ, ප ධ ම ප ග ම
(2) ස රි ග ම ග, ස රි ස
(3) ම ග, ස රි ස, ධ නි ස
(4) නි ස ග ම, ධ ම ධ ප

**5.** පංචමය සහ ෂඩ්ජය පිළිවෙළින් වාදී සහ සංවාදී ලෙස යෙදෙන නිර්දේශිත රාගය තෝරන්න.

(1) භූපාලි (2) බිලාවල් (3) යමන් (4) කාෆි

**6.** | 0 ගරි නිධ නිරි ගරි | 3 ග– නිරි ග– නිරි | x ග | ලෙසින් තානාලංකාරයක් යොදා ගත හැකි රාගය කුමක් ද?

(1) කාෆි (2) බිලාවල් (3) භූපාලි (4) යමන්

**7.** රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගැයීමට නියමිත කල්‍යාණ මේලගත රාගය තෝරන්න.

(1) භෛරවී (2) භූපාලි (3) කාෆි (4) බිලාවල්

**8.** බිලාවල් රාගය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) පූර්වාංගවාදී රාගයකි.
(2) ඖඩව ජාති රාගයකි.
(3) සියලුම ස්වර ප්‍රකෘති ස්වර ලෙස යෙදෙන රාගයකි.
(4) රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගැයීමට නියමිත රාගයකි.

**9.** භූපාලි රාගය සම්බන්ධයෙන් සරිගගරිස, රිගපපගරි වශයෙන් ආරෝහණ ක්‍රමයට යෙදෙන ස්වර අභ්‍යාසයේ අවරෝහණ රූපයෙහි පළමු සහ දෙවන ස්වර රටාවන් දෙක පිළිවෙළින් සඳහන් වන වරණය තෝරන්න.

(1) ස නි ධ ධ නි ස , ධ ප ග ග ප ධ (2) ස ධ ප ප ධ ස , ධ ප ග ග ප ධ

(3) ස නි ධ ධ නි ස , නි ධ ප ප ධ නි (4) ස ධ ප ප ධ ස , නි ධ ප ප ධ නි

**10.** රාගවල යෙදෙන ස්වර විශේෂ යටතෙහි **ගාන්ධාරය** සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) බිලාවල් රාගයෙහි සංවාදී ස්වරය ලෙස යෙදේ.

(2) කාෆි රාගයෙහි කෝමල ස්වරයක් ලෙස යෙදේ.

(3) යමන් රාගයෙහි වාදී ස්වරය ලෙස යෙදේ.

(4) භූපාලි රාගයෙහි වර්ජ්‍ය ස්වරයක් ලෙස යෙදේ.

**11.** "ධා" සහ "න" යන අවනද්ධාක්ෂර දෙවරගයම යෙදෙන තාල දෙකක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ජප් තාලය සහ දාදරා තාලය (2) දාදරා තාලය සහ කෙහෙර්වා තාලය

(3) කෙහෙර්වා තාලය සහ දීප්චන්දි තාලය (4) දීප්චන්දි තාලය සහ ත්‍රිතාලය

**12.** හින්දුස්තානි තාල පිළිබඳ සැලකීමේ දී, මාත්‍රා තුනකින් යුත් විභාග එකක් වත් නො යෙදෙන තාලය තෝරන්න.

(1) දාදරා (2) ජප් (3) දීප්චන්දි (4) කෙහෙර්වා

● අංක **13** සහ **14** හි සඳහන් ප්‍රශ්න සඳහා පහත A, B, C යටතේ දක්වා ඇති තොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න.

A – දායාවෙන් හඬ උපදවීම

B – බායාවෙන් හඬ උපදවීම

C – දායා සහ බායා යන දෙකොටසින්ම එකවර හඬ උපදවීම

**13.** ඉහත A, B, C යටතෙහි සඳහන්ව ඇත්තේ තබ්ලාවෙන් අවනද්ධාක්ෂර උපදවන ආකාර තුනකි. ඒ අනුව පිළිවෙළින් |C|A|B|A| ලෙස හඬ උපදවන ආකාරයට යෙදී ඇති අවනද්ධාක්ෂර පෙළ නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

(1) |ධා – – ධා | තිට කිට | කත් තිට | ගෙ ගෙ තිට |

(2) |ධා – – ධි | නන තිට | කත් – ක | තිට තිට |

(3) |කත් තිට | තිට කිට | ධා ධා තිට | ගෙ ගෙ තිට |

(4) |ධා ගෙ තිට | කත් තිට | ධි න – ධා | තිට තිට |

**14.** ජප් තාලයෙහි ඨේකාවට අනුව හඬ උපදවීමේ නිවැරදි ක්‍රමය සඳහන් වරණය තෝරන්න.

(1) |B A|CCB|AA|CCB| (2) |C A|CCA|AA|CCA|

(3) |C A|CCA|BA|CCA| (4) |C B|CCB|BB|CCB|

**15.** හඬ නිෂ්පත්තිය හා සැලකීමේ දී හඬ තරංගයක ගොඩනැගෙන,

(1) ශීර්ෂ මගින් වායු අණු එකිනෙක තෙරපීම, විරලනය ලෙස හැඳින්වේ.

(2) නිම්න මගින් වායු අණු එකිනෙක ඉහිල්වීම, සම්පීඩනය ලෙස හැඳින්වේ.

(3) සමාකාරී කම්පනවලින් යුතු වන්නේ, නාදයයි.

(4) විස්තාරයෙන් නාදයෙහි උච්චනීච භේදය පෙන්නුම් කරයි.

**16.** ගසල් ගායනයට සුප්‍රසිද්ධ භාරතීය සංගීත ශිල්පියෙකු වන්නේ,

(1) හරිප්‍රසාද් චෞරසියා ය. (2) ඒ.ආර්. රහ්මාන් ය.

(3) ජග්ජිත් සිංග් ය. (4) ශකීර් හුසේන් ය.

● අංක **17** සහ **18** හි සඳහන් ප්‍රශ්න සඳහා පහත ස්වර ප්‍රස්තාරය ඇසුරින් පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| ග – ග | ප – ධ ප | ස̇ – – | ස̇ – ස̇ – |
| නි – ධ | නි – රි̇ – | ග̇ – රි̇ | ස̇ – – – |
| 0 | 3 | x | 2 |

**17.** ඉහත ස්වර ප්‍රස්තාර කොටසින් පිළිබිඹුවන රාගය තෝරන්න.
(1) භූපාලි (2) කාෆි (3) බිලාවල් (4) යමන්

**18.** ඉහත ස්වර ප්‍රස්තාරයට අදාළ හින්දුස්තානි තාලය වන්නේ,
(1) දීප්චන්දි තාලයයි. (2) ජප් තාලයයි. (3) ලාවනී තාලයයි. (4) ත්‍රිතාලයයි.

**19.** සමුද්‍රඝෝෂ වෘත්තයට අනුව රචනා වී ඇති සේ ගී පාදයක් තෝරන්න.
(1) ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ
(2) පුන්මදාරා මල් දමින් යුත් දිගු සුනිල් වරලස ශෝභා
(3) සුරරදු සමන් සමඟින් සුරඟන එ වර
(4) කලු ගල් තලාලයි පාරට දමන්නේ

**20.** "සේවිත පාද සරෝරුහ සංචිතයෙන් ඉතා" මෙම පහතරට සින්දු වන්නම ගැයෙන තිත
(1) මැදුම් තනිතිත වේ.
(2) සුළු මැදුම් දෙතිත වේ.
(3) මහ තනිතිත වේ.
(4) මැදුම් මහ දෙතිත වේ.

**21.** "දොඹම් කපාලා ඇඹුල් තනාලා" කෙළි ගීතය අයත් වන ජනක්‍රීඩාව තෝරන්න.
(1) අං කෙළිය
(2) ඔළිඳ කෙළිය
(3) ලී කෙළිය
(4) මේවර කෙළිය

**22.** කෝට්ටේ යුගයේ රචනා වූ සැළලිහිණි, ගිරා සහ පරෙවි වැනි සන්දේශ කාව්‍ය ඇතුළත් ග්‍රන්ථ හැඳින්විය හැක්කේ
(1) සේ ගී ග්‍රන්ථ ලෙස ය.
(2) මෙහෙ ගී ග්‍රන්ථ ලෙස ය.
(3) ඇඳහිලි ගී ග්‍රන්ථ ලෙස ය.
(4) සමාජ ගී ග්‍රන්ථ ලෙස ය.

**23.** දයානන්ද ගුණවර්ධන සූරීන්ගේ ගජමන් පුවත, මධුර ජවනිකා සහ ජසයා හා ලෙන්චිනා වැනි නාට්‍ය සඳහා සංගීත නිර්මාණයෙන් දායක වූ සංගීතඥයා වන්නේ
(1) ඩබ්ලිව්.බී. මකුලොලුව ය.
(2) ලයනල් රන්වල ය.
(3) සී. ද එස්. කුලතිලක ය.
(4) රෝහණ බැද්දගේ ය.

**24.** 'දුනු කෙයියා මලක් වගේ දුරට පෙනෙනවා' ගීතය
(1) පියගුණ වරුණ ගීතයකි.
(2) මව්ගුණ වරුණ ගීතයකි.
(3) දේශාභිමානී ගීතයකි.
(4) පරිසර වර්ණනාත්මක ගීතයකි.

**25.** 'පාරමිතා බල පූරිත පූජිත බුද්ධ දිවාකරයාණෝ' ගීතයට අදාළ තාලය වනුයේ
(1) දීප්චන්දි තාලයයි. (2) ජප් තාලයයි. (3) කෙහෙර්වා තාලයයි. (4) දාදරා තාලයයි.

**26.** වික්ටර් රත්නායකයන් විසින් සංගීත අධ්‍යක්ෂණය කරන ලද 'හුලවාලි' චිත්‍රපටයේ ඇතුළත් ගීතයක් තෝරන්න.
(1) උන්මාද සිතුවම්
(2) ආරිච්චි බෝරිච්චි
(3) ගලන ගඟකි ජීවිතේ
(4) කුලගෙදරින් දුම්බර කඳුවැටියේ

**27.** "තෙරේ මේරේ මිලන් කී" ගීතය අයත් හින්දි චිත්‍රපටය තෝරන්න.
(1) ජනක් ජනක් පායල් බාජේ
(2) මධුමතී
(3) අභිමාන්
(4) බෛජූ බාව්රා

**28.** "සුදු සඳ එළියේ නලමත පොපියන" ගීතයේ පද ප්‍රබන්ධ කර ඇත්තේ
(1) මහගමසේකර විසිනි.
(2) ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ විසිනි.
(3) ප්‍රේමකීර්ති ද අල්විස් විසිනි.
(4) මර්සලීන් ජයකොඩි පියතුමා විසිනි.

[අනෙක් පිටුව බලන්න

**29.** ගුවන් කැටි යුගයට අයත් ගීතයක් තෝරන්න.
(1) බැස සීතල ගඟුලේ
(2) ගලන ගඟක් ජීවිතේ
(3) හෝපලු වනපෙත
(4) සිහිදු සුදු මුතු තලාවේ

**30.** ගුවන් විදුලි සරල ගී, මුල් යුගයට අයත් සංගීතඥයෙකු තෝරන්න.
(1) සූර්ය ශංකර් මොල්ලිගොඩ
(2) කරුණාරත්න දිවුල්ගනේ
(3) සුනිල් එදිරිසිංහ
(4) එච්.ආර්. ජෝතිපාල

**31.** අපරදිග ස්වර ප්‍රස්තාරකරණයේ දී මාත්‍රා හයක නිශ්ශබ්දතාවය දැක්වීම සඳහා යොදනු ලබන සංකේතය හඳුන්වනුයේ
(1) ඩොටඩ් මිනිම් රෙස්ට් (Dotted Minim Rest) ලෙස ය.
(2) ඩොටඩ් ක්වේවර් රෙස්ට් (Dotted Quaver Rest) ලෙස ය.
(3) ඩොටඩ් සෙමි බ්‍රිව් රෙස්ට් (Dotted Semi breve Rest) ලෙස ය.
(4) ඩොටඩ් ක්‍රොචට් රෙස්ට් (Dotted Chrochet Rest) ලෙස ය.

**32.** අපරදිග සංගීතයෙහි එක් ස්කේලයක් තුළ (Scale) භාවිත කළ හැකි Major Chords ගණන
(1) 2 කි.
(2) 3 කි.
(3) 4 කි.
(4) 5 කි.

**33.** ධ රි ග ස්වර තුන ඇතුළත් ස්වර සංචය (chord) තෝරන්න.
(1) A Minor
(2) D Minor
(3) A Major
(4) D Major

**34.** | ග ප ප ධ | ම — — — | ග ග ග ස | රි — — — |
ඉහත ස්වර පාදය හා ගැළපෙන (සංවාද වන) හාමනි (Harmony) ස්වර පාදය තෝරන්න.
(1) | ප නි නි ස් | ධ — — — | ප ප ප ග | ම — — — |
(2) | ම ග ග රි | ස — — — | ස ස ස ග | ම — — — |
(3) | ග රි රි ම | ග — — — | ප ප ප ග | රි — — — |
(4) | ස ග ග ම | ධ — — — | ප ප ප ම | ග — — — |

**35.** සී නැචුරල් මයිනර් (C Natural Minor) ස්කේලයට අයත් නිවැරදි ස්වර සඳහන් වරණය තෝරන්න.
(1) ස රි ගු ම ප ධු නි ස්
(2) ස රි ගු ම ප ධු නි ස්
(3) ස රි ගු ම ප ධ නි ස්
(4) ස රි ග ම ප ධු නි ස්

**36.** පහත සඳහන් උපකරණ අතුරෙන්, පටිගත කරන ලද ගීතයක් ගබඩා කර ගත හැකි උපකරණය තෝරන්න.
(1) හෙඩ්ෆෝන් (Head phone)
(2) මයික්‍රෝෆෝන් (Microphone)
(3) මිඩි කේබල් (Midi cable)
(4) USB පෙන් ඩ්‍රයිව් (USB Pen drive)

**37.** මල්ටි ට්‍රැක් රෙකෝඩින් (Multi Track Recording) සඳහා යොදා ගත හැකි මෘදුකාංගයක් තෝරන්න.
(1) Adobe reader
(2) PageMaker
(3) InDesign
(4) Logic pro

**38.** සුෂිර වාද්‍ය ගණයට අයත් **නොවන** ස්වර පුවරු සහිත වාද්‍ය භාණ්ඩයක් තෝරන්න.
(1) පියානෝ
(2) එකෝඩියන්
(3) මෙලෝඩිකා
(4) හාර්මෝනියම්

**39.** දේශීය භාණ්ඩ වර්ගීකරණයෙහි තාල වාද්‍ය විශේෂ පමණක් දැක්වෙන වරණය තෝරන්න.
(1) ආතත, විතත, ඝණ, සුෂිර
(2) විතත, විතතාතත, ඝණ, සුෂිර
(3) ආතත, විතත, විතතාතත, ඝණ
(4) ආතත, විතත, විතතාතත, සුෂිර

**40.** පර්දා (frets) යොදා ස්වර ස්ථාන පෙන්නුම් කර ඇති තත් වාද්‍ය භාණ්ඩ තුනක් ඇතුළත් වරණය තෝරන්න.
(1) සිතාර්, ගිටාර්, එස්රාජ්
(2) ගිටාර්, එස්රාජ්, වයලින්
(3) වයලින්, දිල්රුබා, වීණා
(4) වීණා, සිතාර්, තාම්පුරා

❋ ❋

/ඊළඟ පිටුව බලන්න

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
# க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2023 (2024)

විෂය අංකය / பாட இலக்கம் : **40**

විෂය / பாடம் : පෙරදිග සංගීතය

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 2 | 21. | 2 | 31. | 3 |
| 02. | 2 | 12. | 4 | 22. | 1 | 32. | 2 |
| 03. | 1 | 13. | 2 | 23. | 4 | 33. | 3 |
| 04. | 3 | 14. | 2 | 24. | 2 | 34. | 1 |
| 05. | 4 | 15. | 3 | 25. | 3 | 35. | 2 |
| 06. | 4 | 16. | 3 | 26. | 4 | 36. | 4 |
| 07. | 2 | 17. | 4 | 27. | 3 | 37. | 4 |
| 08. | 3 | 18. | 1 | 28. | 4 | 38. | 1 |
| 09. | 2 | 19. | 3 | 29. | 1 | 39. | 3 |
| 10. | 4 | 20. | 4 | 30. | 1 | 40. | 1 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை | | I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி | |
|---|---|---|---|
| | 25 | | 25 |
| | 40 | | 40 |

## 11 පත්‍රයේ අභිමතාර්ථ

(01) i. රාගධාරී ගීත ප්‍රබන්ධ හඳුන්වනු ලබන සුවිශේෂී නාමය ලියා දක්වයි.

ii. රාගධාරී ස්වර ප්‍රබන්ධ හඳුන්වනු ලබන සුවිශේෂී නාමය ලියා දක්වයි.

iii. රාගධාරී සංගීතයේ දී ශ්‍රැති වාදනය සඳහා යොදා ගන්නා සංගීත භාණ්ඩය නම් කරයි.

iv. ලයෙහි ප්‍රභේද ලියයි.

v. දේශාභිමානී ගීතයක මුල් ගායකයා නම් කරයි.

vi. ගී පාදය අයත් නාට්‍යයේ නිෂ්පාදකවරයා නම් කරයි.

vii. ගී පාදයේ සඳැස් මත් ගණනය කරයි.

viii. ග්‍රහ පිහිටුවීම සම්පූර්ණ කරයි.

ix. රාගධාරී සංගීතයට අයත් තාල දෙකක නම් ලියයි.

x. රංග ශෛලීන් දෙකක තාල වාද්‍ය හඳුන්වයි.

(02) i. විකෘති ස්වර 1ක්, 2ක් හා 4ක් ඇතුළත් රාග නම් කරයි.

ii. නිර්දේශිත රාගයක මධ්‍යලය ගීතයේ ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කරයි.

iii. තෝරා ගත් රාගයකට අදාළ තානාලංකාර දෙකක් ලියයි.

(03) i. A හා B රාග දෙක නම් කරයි.

ii. A හා B රාග දෙකින් කැමති රාගයකට අයත් ස්වර රචනාවක් ගොඩ නගයි.

iii. දීප්චන්දි තාලය නිවැරදි ව ප්‍රස්තාර කරයි.

(04) i. මෙහෙ ගී වර්ග නම් කරයි.

ii. ජන ගී පාද ආඝාතාත්මක හා අනාඝාතාත්මක වශයෙන් බෙදා දක්වයි.

iii. වගුවේ තොරතුරු සම්පූර්ණ කරයි.

iv) වන්නම් සම්ප්‍රදායන් තුනට අදාළවන වන්නම් ලියා දක්වයි

(05) i. නූර්ති නාට්‍ය නිෂ්පාදකයින් නම් කරයි.

ii. නූර්ති රංග ශෛලියේ සංගීත ලක්ෂණ ලියයි.

iii. ස්වර ප්‍රස්තාරයට ගැලපෙන නූර්ති ගීතයේ පදමාලාවද සමග නැවත ගීත ස්වර ප්‍රස්තාර කරයි.

(06) i. අපරදිග ස්වර ප්‍රස්තාරයක් පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කරයි.

ii. A සිට F දක්වා ඇතුළත් ප්‍රස්තාර සංකේත වෙන වෙනම නම් කරයි.

iii.

a) රූප සටහනේ දැක්වෙන බටහිර ස්කේල නම් කරයි.

b) රූප සටහනේ දැක්වෙන ප්‍රස්තාරයේ ටයිම් සිගනේචරය (Time Signature) ලියයි

(07) i. ග්‍රැමෆෝන් ගීතයන්හි සුවිශේෂී ලක්ෂණ ලියා, ගී තනු නිර්මාණය කළ සංගීතඥයෙකු නම් කර එම යුගයේ නිර්මාණය වූ ජනප්‍රිය ගීතයක් ලියා දක්වයි.

ii. කපිරිඤ්ඤා ගීතයන්හි සුවිශේෂී ලක්ෂණ ලියා, එම ගී තනුවක් ආශ්‍රයෙන් නිර්මාණය කර ඇති සරල ගීතයක් ලියා දක්වයි.

iii. ලංකාවේ කණ්ඩායම් සංගීතයේ සුවිශේෂී ලක්ෂණ ලියා, එවක ප්‍රචලිත සංගීත කණ්ඩායමක් හා ගීතයක් නම් කරයි.

iv) නිර්දේශිත නව නාට්‍ය දෙකක් හා ගීත දෙකක පළමු පාදයන් ලියයි.

1. අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(i) රාගයකට අනන්‍ය වූ සුවිශේෂී අංග සහ විස්තර ඇතුළත් රාගධාරී ගීත ප්‍රබන්ධ හඳුන්වනු ලබන සුවිශේෂී නාමය ලියන්න.

(ii) රාගයකට අදාළ ස්වර සහ සංගති ඇතුළත්ව ස්ථායි, අන්තරා වශයෙන් නිර්මාණය වී ඇති තාලානුකූල රාගධාරී ස්වර ප්‍රබන්ධ හඳුන්වනු ලබන සුවිශේෂී නාමය ලියන්න.

(iii) රාගධාරී සංගීතයේදී ශ්‍රැති වාදනය සඳහා යොදා ගැනෙන තත් සතරකින් යුත් සංගීත භාණ්ඩයේ නම ලියන්න.

(iv) හින්දුස්තානි සංගීතයට අනුව ලයෙහි ප්‍රභේද තුන නම් කරන්න.

- අංක (v) සිට (viii) තෙක් ඇති ප්‍රශ්න යටතේ යෙදී ඇති හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(v) දේශාභිමානී ගීතයක් වන "ලංකා ලංකා පෙම්බර ලංකා" ගීතයේ මුල් ගායනය සිදුකර ඇත්තේ .......................... සූරීන් විසිනි.

(vi) "ප්‍රේමයෙන් මන රංජිත වේ නන්දිත වේ" ගීතය ඇතුළත් නව නාට්‍යය නිෂ්පාදනය කරන ලද්දේ .......................... සූරීන් විසිනි.

(vii) "මත්මත් කරවන - දන මුළු දෙරණා" පැදි පාදයට අයත් සඤ්ඤාත් සංඛ්‍යාව .................. කි.

(viii) ජන ගී ප්‍රස්තාරකරණයේදී සමග්‍රහ, .................. සහ විෂමග්‍රහ වශයෙන් ග්‍රහ පිහිටුවන ආකාර තුනකි.

(ලකුණු 01 × 08 = 08 යි)

- අංක (ix) සහ (x) ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(ix) විභාග දෙකක් පමණක් යෙදෙන නිර්දේශිත හින්දුස්තානි තාල දෙකක් වනුයේ (a)............ තාලය සහ (b)............ තාලයයි.

(x) තුර්කි සඳහා යොදා ගැනෙන ප්‍රධාන අවනද්ධ වාද්‍ය භාණ්ඩය (a)............ නමින් හැඳින්වෙන අතර නාඩගම් සඳහා (b).......................... නම් අවනද්ධ වාද්‍ය භාණ්ඩය යොදා ගැනේ.

(ලකුණු 02 × 02 = 04 යි)

(මුළු ලකුණු 12 යි)

1)

i) ලක්ෂණ ගී

ii) සර්ගම්, ස්වර මාලිකා, ගත් වාදිත

iii) තාම්බූරාව, තාම්පුරාව

iv) විලම්බ ලය, මධ්‍ය ලය, ද්‍රැත ලය

v) සුනිල් සාන්ත

vi) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර

vii) 16

viii) අවග්‍රහ

(ලකුණු 01 × 08 = 08 යි)

ix) දාදරා, කෙහෙර්වා, බෙම්ටෝ

x) (a) තබ්ලා

ල. (b) මද්දල

(ලකුණු 02 × 02= 04 යි)

(මුළු ලකුණු 12 යි)

2. (i) පහත A, B, C අක්ෂර යටතෙහි සඳහන් කරුණුවලින් හඳුනාගත හැකි නිර්දේශිත රාග තුනෙහි නම් අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග වෙන වෙන ම ලියන්න.

A – විකෘති ස්වර එකක් පමණක් ඇතුළත්ව ස්වර 7ක් යෙදෙන රාගයකි.

B – විකෘති ස්වර දෙකක් පමණක් ඇතුළත්ව ස්වර 7ක් යෙදෙන රාගයකි.

C – විකෘති ස්වර හතරක් පමණක් ඇතුළත්ව ස්වර 7ක් යෙදෙන රාගයකි. (ලකුණු 03 යි)

(ii) ඉහත කරුණුවලින් පිළිබිඹු වන රාග තුනෙන්, ඔබ කැමති රාගයකින්, පහත එක් වර්ගයකට අදාළ ව ස්ථායි කොටසෙහි ස්වර ප්‍රස්තාරය නියමිත තාල සංකේත ද සහිතව ලියන්න.

- මධ්‍යලය ඛ්‍යාල් ගීතය
- මධ්‍යලය ගත් වාදිතය
- රාග ලක්ෂණ ගීතය
- සර්ගම් ප්‍රබන්ධය (ලකුණු 05 යි)

(iii) ඉහත A, B හා C හි සඳහන් කරුණුවලින් පිළිබිඹුවන රාග තුනෙන්, ඔබ කැමති එක් රාගයකට අදාළව මාත්‍රා 8 කට නො අඩු තානාලංකාර දෙකක් වෙන වෙන ම ලියන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 12 යි)

i) A,B,C වශයෙන් රාග තුන පිළිවෙලින් නම් කිරීමට (ලකුණු 01 × 03= 03 යි)

ii)

- නිවැරදි තාල සංකේත දක්වා තිබීම - ල. 01
- නිවැරදිව ලියා ඇති ස්වර ප්‍රස්තාරයේ එක් ආවර්ථයකට (ලකුණු 02×02= 04 යි)

iii) තෝරාගත් රාගයට අදාළව මාත්‍රා 8 කට නොඅඩු තානාලංකාර දෙකක් ලියා දැක්වීමට

- ස්වර සංගති පිළිබිඹු වීම (ලකුණු 01 × 02= 02 යි)
- අවම වශයෙන් මාත්‍රා 8 ක් ඇතුළත් වීම (ලකුණු 01 × 02= 02 යි)

○ ලකුණු 04 යි.

1.

A යමන් රාගය

B කාෆි රාගය

C භෛරවී රාගය

(ලකුණු 01 × 03= 03 යි)

ii) ඉහත රාග තුනෙන් එකකට අදාළව තෝරාගත් කොටසෙහි ස්වර ප්‍රස්තාරයෙහි ස්ථායි කොටස ලිවීමට

3. (i) පහත A සහ B අක්ෂර යටතෙහි සඳහන් රාග සංගතිවලින් පිළිබිඹුවන හින්දුස්ථානි රාග දෙකෙහි නම් අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමඟ වෙන වෙන ම ලියන්න.

A – ගම, ධනිස, සනිධප
B – පග, ධපග, රිසධස (ලකුණු 02 යි)

(ii) ඉහත A හා B හි සංගතිවලින් පිළිබිඹුවන රාග දෙකෙන් එක් රාගයක් තෝරාගෙන පහත දී ඇති උපදෙස් අනුව ස්වර රචනාවක් නිර්මාණය කරන්න.

උපදෙස් :-
- තෝරාගත් රාගයට අදාළව A හෝ B හි දක්වා ඇති ස්වර සංගතියක් නිර්මාණයෙහි ඇතුළත් විය යුතු ය.
- ත්‍රිතාලයෙහි ආවර්ත දෙකක් සම්පූර්ණ වන ලෙස නිර්මාණය ගොඩනගා තිබිය යුතු ය.
- නිර්මාණය ස්වර ප්‍රස්තාර කර තිබිය යුතු ය. (ලකුණු 06 යි)

(iii) දීප්චන්දි තාලයෙහි ඨේකාව නියමිත මාත්‍රා විභාග අනුව තාල සංකේත ද සහිතව සමලයෙන් යුතුව ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

i) A,B වශයෙන් රාග දෙක නම් කිරීමට (ලකුණු 01 × 02= 02 යි)

ii) බිලාවල් හෝ භූපාලි යන රාග දෙකෙන් එක් රාගයකට අනුකූලව ස්වර රචනාව

නිර්මාණය වී තිබිය යුතු ය. එහි දී,

- ඉහත A,B, කොටස් වල යෙදී ඇති සංගතියක් (තෝරා ගත් රාගයට අදාළව) නිර්මාණය තුළ අන්තර්ගත වීම සඳහා **ලකුණු 01 කි.**
- නිර්මාණාත්මක කුසලතාව (අදාළ රාග ආශ්‍රිතව) සඳහා **ලකුණු 04 යි.**

  මෙහි දී නිර්මාණයේ ගුණාත්මක භාවය අගයමින් ලකුණු 01 හෝ 02 හෝ 03 ක් හෝ 04 ක් හෝ වශයෙන් ලබා දීම සුදුසු ය. (රාගයට අනුකූලව නිර්මාණය ගොඩනගා නොමැති නම් ලකුණු හිමි නොවේ.)
- නිර්මාණය නිවැරදි ක්‍රමයට ස්වර ප්‍රස්තාර කර තිබීම සඳහා (ප්‍රස්තාරයක කුසලතා අගයමින්) **ලකුණු 01කි.**

**මුළු ලකුණු ( 01+02+02+01=06)**

iii) දීප්චන්දි තාලය දී ඇති උපදෙස් අනුව ප්‍රස්තාර කර ඇති විටෙක,

- ඨේකාවේ නිවැරදිතාවය සඳහා (විභාගයකට ලකුණු ½බැගින් ) මාත්‍රා විභාග 04ට ලකුණු 02 කි.
- තාල සංකේත නිවැරදිව යෙදීමට ලකුණු 01 කි.
- තාලයේ ඨේකාව නිවැරදිව බෙදෙන ආකාරයට විභාග ගත කර ප්‍රස්තාර කර ඇති විටෙක ලකුණු 01 කි.

**මුළු ලකුණු ( 01+02+01=04)**

4. (i) 'මෙහෙ ගී' යටතට ගැනෙන ජන ගී වර්ග **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත දැක්වෙන ජන ගී පාද ආඝාතාත්මකව ගයන ලද ගී පාද සහ අනාඝාතාත්මකව ගයන ලද ගී පාද වශයෙන් කොටස් දෙකක් යටතේ බෙදා වෙන්කර ලියන්න.

(a) කණ්ඩලේ දෙන්නා දෙපොලේ දක්කනවා
(b) උදයට පායන හිරු දෙවියන්ටයි
(c) බුද්ධං සරණේ සිරස දරාගෙන
(d) මලේ මලේ ඔය නා මල නෙලා වරෙන්
(e) ඊගත් සුරා පිරූ විකින්
(f) වෙල්යායක ගොන් දෙන්නෙක් කකා උති
(g) ඔළිඳ කිබෙන්නේ කොයි කොයි දේසේ
(h) රන් ඇ කැකි ගෙන තිති සැරසෙනවා

(ලකුණු 04 යි)

(iii) වන්නම් සම්ප්‍රදායන් තුන හා සම්බන්ධව තිරස් අතට ගැළපෙන ලෙස සකසා ඇති පහත වගුවෙහි A සිට F දක්වා හිස්තැන්වලට නියමිත කරුණු අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමඟ ලියන්න.

| වන්නම් අයත් සම්ප්‍රදාය | භාවිත වන ප්‍රධාන අවනද්ධ වාද්‍ය භාණ්ඩය | භාවිතයේ පවතින වන්නම් ගණන |
|---|---|---|
| (A) ........................ | ගැටබෙරය | (B) ........................ |
| (C) ........................ | (D) ........................ | 18 |
| පහතරට | (E) ........................ | (F) ........................ |

(ලකුණු 03 යි)

(iv) ප්‍රධාන වන්නම් සම්ප්‍රදාය තුනට අයත් වන්නම් **තුනක්** අදාළ සම්ප්‍රදාය සමග වෙන වෙනම නම් කරන්න.

(ලකුණු 03 යි)

(මුළු ලකුණු 12 යි)

---

i) මෙහෙ ගී 4 නම් කිරීමට ල. ½×4 = (ල.02 යි)

ii) ගී පාද ආඝාතාත්මක හා අනාඝාතාත්මක වශයෙන් බෙදා වෙන් කර දැක්වීමට

ල. ½ × 8 = (ල.04 යි)

iii) A සිට F දක්වා වගුවේ හිස්තැන් පිරවීමට ල. ½ × 6 = (ල.03 යි)

iv)

- සම්ප්‍රදායන් තුන නම් කිරීමට ල. 1½
- අදාළ වන්නම් වෙන වෙනම නම් කිරීමට ල. 1½ (ල.03 යි)

(මුළු ලකුණු 12 යි)

i) ගොයම් ගී, නෙළුම් ගී, කමත් ගී, පාරු ගී, පතල් ගී, ගැල් ගී, පැල් ගී ආදි මෙහෙ ගී වර්ග

ii)

| ආසාතාත්මක ගී පාද | අනාසාතාත්මක ගී පාද |
|---|---|
| b උදයට පායන | a තණ්ඩලේ දෙන්න දෙපොලේ |
| c බුද්ධං සරණේ | d මලේ මලේ ඔය නා මල |
| e රැගත් සුරා පිරූ විතින් | f වෙල් යායක ගොන් දෙන්නෙක් |
| g ඔළිඳ තිබෙන්නේ | |
| h රන් දැකැති | |

iii) A උඩරට

B 18

C සබරගමු

D දවුල

E පහතරට බෙරය (යක් බෙරය, බොකු බෙරය, රුහුණු බෙරය, සෝෂක බෙරය, මිහිඟු බෙරය දැක සරි බෙරය )

F 32

iv) උඩරට, පහතරට හා සබරගමු සම්ප්‍රදායන් තුනට අයත් වන්නමක් නම් කළ හැක.

පහතරට වන්නම් සඳහා ලකුණු ලබා දීමේ දී පහත කරුණු පිළිබඳව සැලකිලිමත්වන්න.

- සින්දුවන්නම යනුවෙන් ලියා ඇත් නම් ලකුණු හිමි නො වේ.
- වෘත්තය හෝ තාලය යන දෙකෙන් එකක් ලියා ඇත්නම් ලකුනු හිමි වේ.

උදා:-

- නළු ගීතිකා තාලය/ වෙට්ටික්පත්තු වෘත්තය,
- කොණ්ඩනාච්චි තාලය/ ගහකාරක වෘත්තය ......

❖ උඩරට වන්නම 18 තුළ ඇති වන්නම් 10 ක නම් සබරගමු සම්ප්‍රදාය තුළ ද භාවිතා වේ. ඒ අනුව සම්ප්‍රදායන් 02 කටම පොදු වූ පිළිතුරක් ඇති අවස්ථාවක වුව ද ලකුණු ලබා දිය යුතුය. (පහත වගුවට අනුකූලව)

| උඩරට වන්නම් | සබරගමු වන්නම් |
|---|---|
| සැවුලා | සැවුලා |
| ගාහක | ගාහක |
| කිරලා | කිරලා |
| ගජගා | ගජගා |
| තුරගා | තුරගා |
| උරගා | උරගා |
| උකුසා | උකුසා |
| හනුමා | හනුමා |
| මයුරා | මයුරා |
| උදාර | උදාර |

**මුළු ලකුණු ( 01+02+01=04)**

5. (i) නූර්ති නාට්‍ය නිෂ්පාදකයින් **දෙදෙනෙක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) නූර්ති රංග සම්ප්‍රදායේ සංගීතමය ලක්ෂණ **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii) පහත දැක්වෙන්නේ දුටුගැමුණු නූර්තියට අයත් ගීතයක ස්ථායි කොටසේ ස්වර ප්‍රස්තාරයයි. එම ස්වර ප්‍රස්තාරය, ගීතයේ පදමාලාව ද සහිතව නැවත ගීත ස්වර ප්‍රස්තාර කරන්න.

| | | | |
|---|---|---|---|
| ධ ප ධ | ස – රි | ග – ධ | ප – ප |
| ග ග රි | ස – රි | සරිගරි | ස – – |
| ප ධ නි | ස් – ධ | ම – ධ | ප – ප |
| ග ග රි | ස – රි | සරිගරි | ස – – |

(ලකුණු 06 යි)

**(මුළු ලකුණු 12 යි)**

i) නූර්ති නිෂ්පාදකයින් දෙදෙනෙකු නම් කිරීමට ල. 1 ×2 = (ල.02 යි)

ii) නූර්ති රංග සම්ප්‍රදායට අයත් සංගීතමය ලක්ෂණ 4 ලිවීම සඳහා (ල. 1×4 = ල.04 යි)

iii)

- ප්‍රස්තාරයට ඇතුළත් ගීතය හඳුනා ගැනීමට ල. 01
- ස්වර ප්‍රස්තාරය නිවැරදිව පිටපත් කිරීමට ල. 01
- ගී පාද 4 නිවැරදිව ගීත ස්වර ප්‍රස්තාර කිරීමට ල. 04

ලකුණු 06

i)


- නීතිඥ ජෝන් ද සිල්වා සූරීන්
- නීතිඥ චාල්ස් ඩයස් සූරීන්
- සී. දොන් බස්තියන් සූරීන්

ii) නූර්ති නාට්‍යයට අදාළ සංගීතමය කරුණු පමණක් ඇතුළත් විය යුතුය.

- උතුරු ඉන්දීය සංගීතය (හින්දුස්තානී සංගීතය) ඇසුරු කිරීම.
- තබ්ලාව, සර්පිනාව(හාර්මෝනියම්) හා වයලීනය, බටනලාව වැනි සංගීත භාණ්ඩ වාදනය කිරීම.
- නූර්ති ගීත සඳහා දොහොරාව සුවිශේෂී වීම.
- ස්ථායි, අන්තරා ගීත ආකෘතිය භාවිතය.
- ගී තනු සඳහා හින්දුස්තානී රාග ඇසුරු කර තිබීම.
- හින්දුස්තානි තාල භාවිතය.
- පෙර හා අතුරු වාදන සඳහා ගීතයේ මුල් කොටසම වාදනය කිරීම.
- නළු නිලියන් විසින් ම ගීත ගායනයෙහි යෙදීම.

iii) සුවඳ පද්ම ගී තනු ප්‍රස්තාරය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| n | b | n | , | = | . | / | = | e | w | = | w |
| සු | ව | ඳ | ප | ද් | ම | ගී | s | ලු | ආ | s | දි |
| / | / | . | , | = | . | , . | / | . | , | = | = |
| නො | යෙ | ක | පු | ෂ් | ප | යෙ | න් | සැ | දී | s | s |
| w | e | r | t | = | e | q | = | e | w | = | w |
| ස | ර | ණ | හ | ං | ස | සේ | s | රු | බෝ | s | ම |
| / | / | . | , | = | . | , . | / | . | , | = | = |
| පො | කු | ණු | සී | s | ත | පැ | න් | පි | රී | s | s |

6. 

(i) ඉහත දැක්වෙන අපරදිග ස්වර ප්‍රස්තාර කොටස පෙරදිග සංගීත ස්වර ප්‍රස්තාර ක්‍රමයට පෙරළා තාලානුකූලව ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි)

(ii) පහත රූප සටහනෙහි ඉංග්‍රීසි අක්ෂර A සිට F දක්වා ඇතුළත් අපරදිග සංගීත ප්‍රස්තාර සංකේත හඳුන්වනු ලබන යෙදුම්, පහත දී ඇති යෙදුම්වලින් තෝරා අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග ලියන්න.

- ශුද්ධ ලකුණ (Natural Mark), කෝමල ලකුණ (Flat Mark), ක්‍රොචට් රෙස්ට් (Crochet Rest), ටයිම් සිග්නේචර් (Time Signature), කී සිග්නේචර් (Key Signature), ට්‍රෙබල් ක්ලෙෆ්, (Treble Clef), බේස් ක්ලෙෆ් (Bass Clef)

| A | B | C | D | E | F |
|---|---|---|---|---|---|
|  |  |  |  |  |  |

(ලකුණු 06 යි)

(iii) පහත A යටතෙහි දැක්වෙන සංකේතය සහ B යටතෙහි දැක්වෙන ස්වර ප්‍රස්තාරය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| A | B |
|---|---|
|  | \| ස – ස ග – ම \| ප – – ධ – – \| නි – ධ ප – ම \| ග – – , – – – \| |

(a) A අක්ෂරයෙන් දැක්වෙන සංකේතයෙන් පිළිබිඹුවන අපරදිග ස්කේලය (scale) නම් කරන්න.

(b) B අක්ෂරයෙන් දැක්වෙන කොටසෙහි සඳහන් ස්වර ප්‍රස්තාරය අපරදිග රේඛා මණ්ඩලය මත ප්‍රස්තාර කිරීමේදී යොදනු ලබන ටයිම් සිග්නේචරය (Time Signature) ලියන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 12 යි)

6.

i) අපරදිග ප්‍රස්තාර කොටස පෙරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කිරීමට එක් විභාගයකට ල½×8 =ල. 04

ii) A සිට F දක්වා ඇති අපරදිග සංගීත ප්‍රස්තාර සංකේත දී ඇති යෙදුම් වලට ගැළපෙන සේ ඉංග්‍රීසි අක්ෂරය සමග ලිවීමට ල1×6 =ල. 06

iii)

- A අක්ෂරයෙන් පිළිබිඹු වන අපරදිග ස්කේලය නම් කිරීමට ලකුණු 01 යි
- B අක්ෂරයේ සඳහන් ප්‍රස්තාරයට ගැළපෙන ටයිම් සිග්නේචරය (Time Signature) ලිවීමට

ලකුණු 01 යි.

ලකුණු 02

මුළු ලකුණු 12

i) අපරදිග ප්‍රස්තාර කොටස පෙරදිග ක්‍රමයටපෙරළා ප්‍රස්තාර කිරීම

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| b | , | = | ; | . | = | q | = | ; | 3 | w | = |
| w | q3 | w | ; | . | = | ; | w | w | ; | , | , |

ii) A සිට F දක්වා ඇති අපරදිග සංගීත ප්‍රස්තාර සංකේත දී ඇති යෙදුම්වලට ගැළපෙන සේ ඉංග්‍රීසි අක්ෂරය සමග ලිවීම

A කී සිග්නේචර් (Key Signature)

B ශුද්ධ ලකුණ (Natural Mark)

C ටයිම් සිග්නේචර් (Time Signature )

D කෝමළ ලකුණ (Flat Mark)

E ට්‍රෙබල් ක්ලෙෆ් (Treble Clef)

F ක්‍රොචට් රෙස්ට් (Crotchet Rest)

iii)

- A අක්ෂරයෙන් පිළිබිඹු වන අපරදිග ස්කේලය නම් කිරීම
  - a. ජී මේජර් (G major) හෝ ඊ මයිනර් (E minor)
- B අක්ෂරයෙන් සඳහන් ප්‍රස්තාරයට ගැළපෙන ටයිම් සිග්නේචරය
  - b. 6/8 සික්ස් එයිට් (Six eight)

7. පහත සඳහන් ප්‍රශ්න අතුරෙන් **තුනක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.

(i) ග්‍රැමෆෝන් ගීතවල සුවිශේෂ ලක්ෂණ **දෙකක්** ලියා, ග්‍රැමෆෝන් ගීත සඳහා තනු නිර්මාණය කළ සංගීතඥයෙකු හා එම යුගයේ නිර්මාණය වූ ජනප්‍රිය ගීතයක් නම් කරන්න.

(ii) කපිරිඤ්ඤා ගීතවල සුවිශේෂ ලක්ෂණ **තුනක්** ලියා, එම ගී තනුවක් ආශ්‍රයෙන් නිර්මාණය කර ඇති සරල ගීතයක් නම් කරන්න.

(iii) 60-70 දශකයේ මෙරට බිහි වූ කණ්ඩායම් සංගීතයේ සුවිශේෂ ලක්ෂණ **දෙකක්** ලියා, එම දශකය තුළ බිහි වූ ප්‍රචලිත සංගීත කණ්ඩායමක් හා ගීතයක් නම් කරන්න.

(iv) නිර්දේශිත නව නාට්‍ය **දෙකක** නම් ලියා, එම නාට්‍ය දෙකෙහි ඇතුළත් ගීත දෙකක පළමු ගී පාදය බැගින් ලියන්න.

**(ලකුණු 04 × 03 = 12 යි)**

- එක් කොටසක් සඳහා ලකුණු 4 බැගින් කොටස් 3 ට ලකුණු 12 ක් හිමි වේ.

i)

- ග්‍රැමෆෝන් ගීතවල සුවිශේෂී ලක්‍ෂණ දෙකක් ලිවීමට ලකුණු 02
- ග්‍රැමෆෝන් ගී සඳහා තනු නිර්මාණය කළ සංගීතඥයෙකු නම් කිරීමට ලකුණු 01
- ජනප්‍රිය ග්‍රැමෆෝන් ගීතයක් නම් කිරීමට ලකුණු 01

**ලකුණු 04**

ii)

- කපිරිඤ්ඤා ගීතවල සුවිශේෂී ලක්‍ෂණ තුනක් ලිවීමට ලකුණු 03
- කපිරිඤ්ඤා ගී තනු ආශ්‍රයෙන් නිර්මාණය කර ඇති සරල ගීතයක් නම් කිරීමට ලකුණු 01

**ලකුණු 04**

iii)

- 60 -70 දශකයේ මෙරට බිහි වූ කණ්ඩායම් සංගීතයේ සුවිශේෂී ලක්‍ෂණ දෙකක් ලිවීමට ල. 02
- එම දශකයේ බිහි වූ ප්‍රචලිත සංගීත කණ්ඩායමක් හා ගීතයක් නම් කිරීමට ල. 02

**ලකුණු 04**

iv)

- නිර්දේශිත නව නාට්‍ය දෙකක නම් ලිවීමට ල. 02
- එම නාට්‍යයන් හි ඇතුළත් ගීත දෙකක පළමු ගී පාදය බැගින් ලිවීමට ල. 02

**ලකුණු 04**

i)

ග්‍රැමෆෝන් ගීතවල සුවිශේෂී ලක්ෂණ

- ප්‍රථමයෙන් ග්‍රැමෆෝන් ගීත සඳහා නූර්ති ගීත තැටි ගත කිරීම
- හින්දි, ද්‍රවිඩ සහ ඉංග්‍රීසි අනුකාරක ගී තනු බිහිවීම හා නාදමාලාවට ප්‍රමුඛ ස්ථානයක් හිමිවීම.
- ග්‍රැම්ෆෝන් ගීත ලෙස නූර්ති යුගයේ ගීත යොදා ගැනීම.
- දේශීයත්වය පිළිබිඹු වන හෙළ බසින් ගීත ප්‍රබන්ධ වීම හා පදමාලාවට උචිත තනු නිර්මාණය වී තිබීම.
- රාගධාරී සංගීතය ආශ්‍රයෙන් ගී තනු නිර්මාණය වී තිබීම.
- ස්වාධීන ගී තනු පදමාලාවට උචිත ලෙස යොදා තිබීම.
- සෞන්දර්ය, ප්‍රේමය, උපදේශාත්මක හා ආගම භක්තිය දනවන පදමාලාවලින් යුක්ත වීම.
- පෙර හා අතුරු වාදන සඳහා ගීතයේ මුල්තනුවේ කොටස වාදනය කිරීම.
- පියානෝව, හාර්මෝනියම්, ගිටාරය, ක්ලැරිනට්, ඩබල් බේස් හා තබ්ලා වැනි.... සංගීත භාණ්ඩ යොදා ගැනීම. ආදි කරුණු ඇතුළත් විය යුතුය.

❖ ග්‍රැමෆෝන් ගී සඳහා තනු නිර්මාණය කළ සංගීතඥයන් හා ජනප්‍රිය ගීත

- විශ්වනාත් ලෞජි, මොහමඩ් ගවුස්, බී. එස් පෙරේරා, ආර්. ඒ. චන්ද්‍රසේන, ආනන්ද සමරකෝන් හා සුනිල් සාන්ත, සූර්ය ශංකර් මොල්ලිගොඩ .....වැනි ග්‍රැමෆෝන් යුගයේ සිටි සංගීතඥයින්

➢ නූර්ති නාට්‍ය ගීත ලෙස

- සිරි සංඝබෝධි, සීතා මා සිරියා, ශ්‍රියා මනමත් වී, හරිම් රජ සැපා....

➢ හින්දි තනු ආශ්‍රිත ගීත

- දූල් සල් වනේ ලකල්, මහ බෝධි මුලේ, සිරි බුද්ධ ගයා විහාරේ...

➢ රාග ආශ්‍රිත ගීත

- පිට දීප දේශ ජය ගත්තා, මුනි නන්දන සිරි, අඩු කලේ සෙලවීම නිසා.....

➢ ස්වාධීන ගී තනු

- ඇසේ මධුර ජීවනයේ ගීතා, බැස සීතල ගඟුලේ, මව් පියො ආදී...... වැනි ගීත ලියා තිබිය හැක.

ii) කපිරිඤ්ඤා ගීතවල සුවිශේෂී ලක්ෂණ

- කපිරිඤ්ඤා ගී තනු සරල වීම.
- ප්‍රථමයෙන් කාපිරි ජනයා අතර භාවිත වී පසුව සාමාන්‍ය ජනයා අතර ජනප්‍රිය වීම.
- 6/8 රිද්මය භාවිත වීම.
- ලය ක්‍රමයෙන් වැඩිකර ගනිමින් ගැයීම.
- ස්පාඤ්ඤ භාෂාවේ ඇතැම් වචන යොදා ගැනීම.
- සංගීත භාණ්ඩ ලෙස වියෝලා, බැංජෝ, රබන්, ටැම්බරින්, ගිටාර්, මැන්ඩලීන් හා ආදේශ භාණ්ඩ භාවිතය.

❖ කපිරිඤ්ඤා ගී තනු ආශ්‍රයෙන් නිර්මාණය කර ඇති සරල ගීත

- මී වදයකි ජීවිතේ, රස ආහර කවලා, මගේ පැලේ අඳුර නසන්ට, යමන් බංඩො වෙසක් බලන්න, මහා මෙරක් ලෙසට, නා නා වියෝලේ, නෝනා මගෙ නර්ස් නෝනා, ලස්සනට පිපුනු වන මල්, අයිරින්

ජොසපින් රොසලින් ඇංජලින් ආදි ගීත...

iii) 60 -70 දශකයේ මෙරට බිහිවූ කණ්ඩායම් සංගීතයේ සුවිශේෂී ලක්‍ෂණ

- අපරදිග සංගීත ශිල්පීය ක්‍රම භාවිතය (හාර්මනි)
- ගිටාර්, වයලින්, එකෝඩියන්, මර්කාස්, කොංගො, බොංගො ආදී සංගීත භාණ්ඩ භාවිතය..
- සීමිත ස්වර පරාසයක ගී තනු නිර්මාණය වී තිබීම.
- එකම තනුව නැවත නැවත ශ්‍රවණය වීම.
- සරල තනු භාවිතය.
- ස්පාඤ්ඤ සංගීත ආභාසය
- කණ්ඩායමේ වාදකයින් සියලු දෙනා ගීත ගායනයෙන් ද සහාය වීම.
- මූලික කෝඩ්ස් දෙකක් හෝ තුනක් අනුව තනු නිර්මාණය වී තිබීම.
- සජීවී ලෙස ගායනා කිරීම.
- ප්‍රාසංගික සංගීත අංගයක් වීම.
- නර්තනශීලී වේග රිද්මයක් තිබීම.
- ප්‍රේක්ෂකයින් අතරට ගොස් ගායනයේ නිරත වීම.....ආදි කරුණු ගොනු කර තිබිය හැක.

❖ එම දශකයේ බිහිවූ ප්‍රචලිත සංගීත කණ්ඩායම් හා ගීත

- ලා සිලනියන්ස් - හෝයියා හෝයියා, එක්සත් වී, තරුණ ජීවිතේ..
- ලොස් කැබරෙලොස් - මල්බර හිමිදිරියේ, මාමේ මගෙ සුදු මාමේ, උඩරට මැණිකේ
- මී මැස්සෝ - මුලු ගතම වෙහෙසුනා
- මූන්ස්ටෝන් - මංගෝ කළු නැත්දේ, රුවන් පුරය අපේ ගම තමයි..
- ලා බම්බාස් - කලේ උකුලේ තියාලා,
- ත්‍රී සිස්ටර්ස් - වන දෙව් ලිය තුරුලේ, ඔබ සොයනා කලු කෙල්ල මමයි
- ගෝල්ඩන් චයිම්ස් - කඳ සුරිඳුනි, මුව හසරැලි සාගරේ
- ධර්මරත්න බ්‍රදර්ස් - හෝ වැස්ස වහිනවා,
- ලොස් ප්ලෙමින්ගෝස් - කලු කෙල්ලේ ඔබ හරිම හැඩයි
- ජිප්සීස් - පාවෙන පීරිසියක් උඩ, පහසුවටත් වාසියටත්

iv) නිර්දේශිත නව නාට්‍ය

- මනමේ, සිංහබාහු, කාලගෝල, හුණුවටයේ කථාව, තාරාවෝ ඉගිලෙති,රතු හැට්ටකාරී, මධුර ජවනිකා, රාජ කපුරු, අන්දරේලා, තටු, අබුද්දස්ස කෝළම, නරිබෑණා, නල දමයන්ති, මූදු පුත්තු, බෙර හඬ, කරදිය, දෙපානෝ, පේමතෝ ජායතී සෝකෝ, කුස පබාවතී, කුණ්ඩල කේෂී, කුවේණි, සහ

(1956 මෙ පිට බිහි වූ නාට්‍ය)

❖ එම නාට්‍යයන් හි ඇතුළත් ගීත

- ප්‍රේමයෙන් මන, ගල්ලෙන බිඳලා, වගුරට නරනිඳු, යුධ හටය, යුද්දෙට මං ගියා, හෙළ ගැඹුරුයි, යස ඉසුරු, නෙයිනගෙ සුදුව, රස බොජුනක් නැතත්, අපි කිරිල්ලියෝ, අප මුනි සඳ, කුමටද සොබනියේ, හනික වරෙව් කොල්ලනේ, ඇත කඳුකර, මුදු පතුල යට ඉඳලා, අන්න බලන් සඳ, සත් සියක් කපු මල්, ඇඳුරුතුමා වන්න මගේ, මඬේ ලගින තාරාවන්, කොයි යන්නට එනවද බොල,....ආදී ගීත